<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට -"ජ්‍යෙෂ්ඨ සන්නිවේදක නිලධාරී" තනතුරට උසස් කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය

01. ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 10.3.3 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ "ජ්‍යෙෂ්ඨ සන්නිවේදක නිලධාරී" තනතුරේ පුරප්පාඩු 02 ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත සම්පූර්ණ කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන සක්‍රිය සේවයේ සිටින කාලගුණ විද්‍යා සන්නිවේදක නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තනතුරට අදාළ වැටුප් ක්‍රමය :

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර සඳහා හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදි ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු ය.

| | | |
|---|---|---|
| වැටුප් කේත අංකය | : | MN 7-2016 |
| වැටුප් පරිමාණය | : | රු. 41,580-11x755-18x1,030-68,425/- |

03. සපුරාලිය යුතු සුදුසුකම් :

I. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03)සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම.

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

04. බඳවා ගන්නා ආකාරය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

උසස්කිරීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය

| අනු අංකය | ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | <u>සේවා පළපුරුද්ද</u><br><br>(I පන්තියේ වසර 06 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලය ඉක්මවා සපුරා ඇති සක්‍රිය හා සතුටුදායක සේවා කාලය)<br><br>ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු / වැඩිම අමතර සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවු×12+මාස) x අදාළ නිලධාරියාගේ අමතර සක්‍රිය හා සතුටුදායක | (50) | 50 |
| 02. | <u>කුසලතාවය</u><br><br>I. රැකියා ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති පුහුණු<br>• Continuing Education & Training (CET) පුහුණුව (එක් පුහුණුවකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 15)<br><br>• රේඩාර් පුහුණුව, ගුවන් ගමන් කාලගුණ විද්‍යාව පිළිබඳ කටුනායක කාර්යාලයේ සංඥා අංශයේ පුහුණුව (එක් පුහුණුවකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 15)<br><br>II. භාෂා කුසලතාවය - ඉංග්‍රීසි භාෂාව<br>• ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5,6) - ලකුණු 05<br>• ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව (NVQ 3,4) - ලකුණු 02<br><br>III. පරිගණක සාක්ෂරතාවය / පුහුණුව<br>• ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5,6) - ලකුණු 05<br>• සහතික පත්‍ර පාඨමාලාව (NVQ 3,4)- ලකුණු 02<br><br>IV. ප්‍රශංසා සඳහා<br>• පොදු 230 ආකෘතියෙන් ලද ප්‍රශංසා සඳහා (එක් සහතිකයකට ලකුණු 01 බැගින් උපරිම සහතික 05ක් සඳහා) | 15<br><br>15<br><br>05<br><br>05<br><br>05 | 45 |
| | V. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය<br>• සන්නිවේදනය - 1<br>• භාෂා හැකියාව - 1<br>• පෙන්නුම් කර ඇති නායකත්ව කුසලතා - 3 | (05) | 05 |
| | එකතුව | | **100** |

සටහන

- ❖ බඳවා ගැනීමේ දී සලකා බැලූ මූලික සුදුසුකම් වලට අමතරව ලබා ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.
- ❖ කුසලතාවය යටතේ (II) හා (III) සඳහා ඉහළම එක් සුදුසුකමකට පමණක් ලකුණු දෙනු ලැබේ.
- ❖ ඩිප්ලෝමා පාඨමාලාව - පැය 720 හෝ මාස 06 කට නොඅඩු විය යුතුය.
- ❖ සහතික පත්‍ර පාඨමාලාව - පැය 360 හෝ මාස 03 කට නොඅඩු විය යුතුය.
- ❖ ඉහත සඳහන් සියලු ඩිප්ලෝමා සහතික පත්‍ර රජයේ පිළිගත් ආයතනයක් වෙතින් ලබා ගත් සුදුසුකම් විය යුතු අතර සහතික පත්‍ර හා ලේඛන මඟින් සම්මුඛ පරීක්ෂණයේ දී සනාථ කරනු ලබන සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. (සියලුම සහතික පත්‍ර හා ලේඛන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සත්‍ය පිටපත් බවට සහතික කර තිබිය යුතුයි.)

05. අයදුම්පත් යොමු කිරීම :

මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන 2024.04.30 දිනය හෝ ඊට පෙර කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, අංක. 383, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුයි. කවරයේ වම්පස උඩ කෙලවරේ **"කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය - ජ්‍යෙෂ්ඨ සන්නිවේදක නිලධාරී"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

දිනය : 31/3/2024

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

"ජ්‍යෙෂ්ඨ සන්නිවේදක නිලධාරී"

ආදර්ශ අයදුම්පත්‍රය

1. නිලධාරියාගේ නම -..........................................................................................
..........................................................................................................................
2. ලිපිනය -..........................................................................................
..........................................................................................................................
3. උපන්දිනය -..........................................................................................
4. ජාතික හැඳුනුම්පත් අංකය -..........................................................................................
5. මුල් පත්වීමේ දිනය -..........................................................................................
6. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට පත් වූ දිනය -..........................................
7. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සේවා කාලය ......................
..........................................................................................................................
8. පුරප්පාඩු වූ දිනයන්ට පෙරාතුව වසර 06ක කාර්ය සාධනය පිළිබඳ විස්තරය :

| අනු අංකය | වර්ෂය | වැටුප් වර්ධක දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

9. I ශ්‍රේණියට උසස් වූ පසු ඔබ විසින් වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තරය :
..........................................................................................................................

10. දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලද සියලුම පුහුණු පිළිබඳ විස්තර :

| අනු අංකය | පුහුණුව | ආරම්භ කළ දිනය | අවසන් කල දිනය |
|---|---|---|---|
| 01. | රේඩාර් පුහුණුව | | |
| 02. | ගුවන් ගමන් කාලගුණ විද්‍යාව පිළිබඳව කටුනායක කාර්යාලයේ සංඥා අංශයේ පුහුණුව | | |
| 03. | වෙනත් පුහුණුවීම් | | |

11. භාෂා කුසලතාවය - ඉංග්‍රීසි

| අනු අංකය | පාඨමාලාව<br>ඩිප්ලෝමා / සහතික පත්‍ර | ආයතනය | ලබාගත් දිනය / සම්පූර්ණ කල දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |

12. පරිගණක සාක්ෂරතාවය

| අනු අංකය | පාඨමාලාව<br>ඩිප්ලෝමා / සහතික පත්‍ර | ආයතනය | ලබා ගත් දිනය/ සම්පූර්ණ කළ දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |

13. ඔබට විරුද්ධව නොනිමි විනය කරුණු පවතී ද?......................................................................

.......................................................................................................................

14. අයදුම්කරුගේ ප්‍රකාශය :

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව අනාවරණය වුවහොත් උක්ත තනතුර සඳහා මා නුසුදුස්සෙකු වන බවත්, අසත්‍ය හා සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවත් මම දනිමි.

දිනය :..................................

......................................

ඉල්ලුම්කරුගේ අත්සන

15. දෙපාර්තමේන්තු ප්‍රධානී නිර්දේශය:

මෙම ඉල්ලුම්කරු වන ................................................................................ මයා/ මිය/ මෙනවිය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාලගුණ විද්‍යා සන්නිවේදක නිලධාරි I ශ්‍රේණියේ නිලධාරියෙකු / නිලධාරිනියක ලෙස දැනට සේවය කරන බවත්, I ශ්‍රේණියේ වසර 06ක සක්‍රීය හා සතුටුදායක සේවාකාලයක් සපුරා ඇති බවත්, ඔහුට/ ඇයට විරුද්ධව නොනිමි විනය කරුණු පවතින/ නොපවතින බවත්, ඔහු / ඇය මා ඉදිරිපිට දී ඉහත අත්සන් කරන ලද බවත් සහතික කරමි.

දිනය: ...................................

අත්සන : ...............................

නම : ....................................

තනතුර : ....................................

නිල මුද්‍රාව : ....................................